# 21 සියවසේ දැනුම යුගයට එළඹීමත් සමග සාම්ප්‍රදායික අධ්‍යාපනය නූතනවාදී දැනුම් ආර්ථිකයට පරිවර්තනය වීම

**රෝලන්ඩ් අබේපාල**

21 සියවසේ පළමු කාර්තුව ගත වෙමින් පවතිද් දී ලොව පුරා අධ්‍යාපනය ගැන අනාවැකි පෙර නිමිති පළ කරන අධ්‍යාපනඥයින්ගේ අදහස් විවිධ මතිමතාන්තර අතර දෝලනය වන බවක් අන්තර්ජාලය හරහා පෙනී යයි. ඇතැමුන්ගේ අදහස් අනුව ''ඉගෙනුම් සමාජයක්'' (Learning Society) පිළිබඳ සංකල්පය සංවර්ධනය වීමත් සමග ජීවිතය ජීවත්වීම තුළ ම අත්විඳිය යුතු වෙයි. ඉගෙනුම් සමාජයක ලක්ෂණ වනුයේ සැබෑ ඉගෙනුම් අවස්ථා හා අත්දැකීම් ඉගෙනුම සඳහා ම ආයෝජනය කිරීම ය. මේ අනුව ''උගන්වනවාය'' කියන අදහස මෙන්ම ''දැනුම බෙදාදීම'' හෝ ''බෙදාහැරීම'' යන වචන ඉගෙනුම් ශබ්ද කෝෂයෙන් ඉවත්වනු ඇත. ඇතැම් අධ්‍යාපනඥයන්ගේ අදහස් විමර්ශනය කරන විට ජීවිතය හා ජීවත්වීම අතර වෙනසක් ඇති විය නොහැකි ය. එවිට ජීවත්වීම ම ඉගෙනුම බවට පත් වනු ඇත. යාවජීව අධ්‍යාපනය (Life Long Education) යන පැරණි සංකල්පය නව මුහුණුවරකින් පැමිණෙන්නේදැ'යි සිතන්නට වෙයි.

**විශිෂ්ටතා ලක්ෂණ සහ නව ප්‍රවණතා**

දෙවෙනි ලෝක යුද්ධයෙන් පසුව, ලෝකයේ සෑම රටක ම පාහේ උසස් අධ්‍යාපනය ප්‍රසාරණය වී ඇති බවක් පෙනී යයි. ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනයට සාපේක්ෂ ව, පශ්චාත් ප්‍රාථමික අධ්‍යාපනය, සමානුපාතික වශයෙන් විශාල වර්ධනයක් අත්කරගෙන තිබේ. දියුණු රටවල පමණක් නොව, තුන්වන ලෝකයේ රටවල ද මෙම ප්‍රසාරණය කැපී පෙනෙන ලක්ෂණයක් බවට පත්ව පවතී.

උසස් අධ්‍යාපනයේ මෙම ප්‍රසාරණයට හේතුවන කරුණු ගණනාවක් වෙයි. ඒ අතුරින් ප්‍රධානත ම වන්නේ, නිරන්තර ව සංකීර්ණ වෙමින් පවත්නා නූතන සමාජයන් සහ ආර්ථිකයන් වෙතින් ඉහළ පුහුණුවක් සහිත ශ්‍රම බලකායක් සඳහා කෙරෙන ඉල්ලුම ය.

ඒ අනුව, ඉල්ලා සිටිනු ලබන පුහුණුව ලබා දීමට පශ්චාත් ද්විතීයික අධ්‍යාපන ආයතනයන්ට සිදුව ඇත.

එක් කලෙක රැකියාවස්ථාවේ දී ලබාදෙන ලද පුහුණුව වර්තමානයෙහි දී, උසස් අධ්‍යාපන ආයතනවල දී සලසා දෙනු ලබයි. ගණකාධිකරණය, නීතිඥ වෘත්තිය, ඖෂධ පරිහරණය, සන්නිවේදන මාධ්‍ය, ගුරු වෘත්තීය නාට්‍යකරණය, සංගීතය, නර්තනය හා චිත්‍ර ඇඳීම වැනි විෂයයන් ඊට නිදසුන් කිහිපයකි. පරිගණක විද්‍යාව වැනි නව විෂය ක්ෂේත්‍ර උසස් අධ්‍යාපනයට එකතු වී තිබේ. බොහෝ විට මෙම ක්ෂේත්‍රයන් හි පුහුණුව සහ පර්යේෂණ පිළිබඳ වගකීම විශ්වවිද්‍යාලයට පැවරී ඇත. බොහෝ සමාජයන් හි රැකියා ලබාගැනීමේ දී පූර්ව අවශ්‍යතාවක් වනුයේ විශ්වවිද්‍යාල උපාධිය යි.

1970 දසකය ඇරඹෙන විට මෙරට පැවැති ජාතික විශ්වවිද්‍යාල 5ට වාර්ෂිකව ඇතුළත් කර ගන්නා ලද්දේ 4000ක් පමණ ශිෂ්‍ය සංඛ්‍යාවකි. 1970 වර්ෂයේ දී මෙම ලියුම්කරු ද ඉන් එක් ශිෂ්‍යයෙක් විය. දැන් 2022 දී ජාතික විශ්ව විද්‍යාල 17ක් වෙද්දී ශිෂ්‍ය සංඛ්‍යාව වාර්ෂිකව 27,000 පමණ ඉක්මවයි. මේ හැර දේශීය විශ්වවිද්‍යාලවල බාහිර උපාධි පාඨමාලා හදාරණ සහ පෞද්ගලික හා විදේශීය විශ්වවිද්‍යාලවල උපාධි ලබන ශ්‍රී ලාංකික ශිෂ්‍ය සංඛ්‍යාව ද ගණන් බැලිය යුතුව පවතී. අවසානයේ දක්නට ලැබෙන චිත්‍රය එතරම් සතුටුදායක නොවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

උසස් අධ්‍යාපනයේ ප්‍රසාරණයට තවත් හේතුවක් නම්, නූතන සමාජයේ යම් යම් පාර්ශ්ව වෙතින් කෙරෙන ඉල්ලුම ය. ඉහළ සාර්ථකත්වයක් උදෙසා, උසස් අධ්‍යාපනයේ අවශ්‍යතාව වටහා ගෙන ඇති මධ්‍යම පාන්තිකයෝ එම අවස්ථාව වැඩි වශයෙන් ඉල්ලා සිටිති. එවිට බොහෝ රජයන් කරනුයේ ඇතුළත් කර ගැනීමේ සංඛ්‍යාව වැඩිකිරීම ය. එය ද ප්‍රමාණවත් නොවන විට දී ඉල්ලුමට සපුරාලනු සඳහා පුද්ගලික උසස් අධ්‍යාපන ආයතන බිහි වෙයි.

ඉන්දියාව, පිලිපීනය සහ බංග්ලාදේශය වැනි රටවල බහුතර ශිෂ්‍ය සංඛ්‍යාවක් උසස් අධ්‍යාපනය ලබන්නේ පුද්ගලික විද්‍යාපීඨයන් හි සහ විශ්වවිද්‍යාලයන්හි දී ය. ශ්‍රී ලංකාවේ ද විශ්වවිද්‍යාවල ප්‍රවේශ වී අභ්‍යන්තර වශයෙන් ලබා ගන්නා උපාධි සංඛ්‍යාව ඉක්මවන

තරමේ බාහිර හා විදේශීය විශ්වවිද්‍යාල මගින් උපාධි ලබාගැනීමේ ප්‍රවණතාවකට දැන් වන විට අවතීර්ණ වී සිටිති. අද ලොව පුරා රටවල උසස් අධ්‍යාපනයට සම්බන්ධ ප්‍රවණතා තුනක් දක්නට ලැබෙයි.

1. අධික ඉගැන්වීමේ ගාස්තු අය කිරීම.
2. පුද්ගලික අංශයේ උසස් අධ්‍යාපනය වැඩි වැඩියෙන් අවධාරණය කිරීම සහ
3. ආර්ථික වශයෙන් ''පුද්ගලික වෙළෙඳ භාණ්ඩයක්'' ලෙස අධ්‍යාපනය නිර්වචනය කිරීම ආදිය යි.

බොහෝ රටවල අධ්‍යාපනය, ප්‍රාථමික අවදියේ සිට උසස් අධ්‍යාපන අවදියෙහි නිමාව දක්වා ම රජයේ අනුග්‍රහය යටතේ සලස්වනු ලබයි. ඒ අතර බොහෝ රටවල උසස් අධ්‍යාපනයට රජය හා සමගාමීව පුද්ගලික අංශය ද සම්බන්ධ වී ඇත. අනාගතයේදී, පශ්චාත් ද්විතීයික මට්ටමෙහි අවසානය දක්වා අධ්‍යාපනයේ වගකීම රජයන් වෙත තබා ගනිමින්, උසස් අධ්‍යාපනය පුද්ගලික අංශය වෙත මුදා හැරීමේ ප්‍රවණතාවක් ගැන ද අසන්නට ලැබෙයි.

අධ්‍යාපනය ප්‍රජාතන්ත්‍රීයකරණය කිරීමේ සැබෑ අභිලාෂය පසුගිය ශත වර්ෂය පුරා ඇති වූ ප්‍රගතිශීලි චින්තාව අගය කළ යුතු වුවද එහි අතුරු ඵලයක් වශයෙන් විශේෂයෙන් ම ආසියානු අප්‍රිකානු රටවල සාවද්‍ය අධ්‍යාපනය (Mis Education) දිගින් දිගට ම ව්‍යාප්ත කරවීම අද සිට ආපසු හැරී බලන විට බරපතල ඉච්ඡාභංගත්වයක් බව සඳහන් කළ යුතු ව පවතී.

### අධ්‍යාපන ක්‍රමය සහ රැකියා වෙළඳපොළ අතර නොගැළපීම

දැනට සිටින ඉහළ මධ්‍යම ප්‍රවර්ගීකරණය සිට, ඉහළ ආදායම් සහිත රටක් බවට පත් වීමට ශ්‍රී ලංකාව උත්සාහ දරයි. මෙය සාක්ෂාත් කරගත හැකි ඉලක්කයකි. කෙසේ වුව ද, ඒ සඳහා පුරවැසියන්ගේ දායකත්වය උපරිමයෙන් ලබා ගැනීමට නම්, අධ්‍යාපනය සම්පූර්ණ කර, රැකියා වෙළෙඳපොළට වාර්ෂිකව ප්‍රවේශ වන ලක්ෂ සංඛ්‍යාත තරුණ ජනයා සඳහා රැකියා අවස්ථා උත්පාදනය කළ යුතු ව ඇත.

කඩිනම් අවධානය යොමුවිය යුත්තේ, කුසලතා පාදක පුහුණුවක් නොලැබීම, යල්පිනූ විෂයමාලාව. සහ ප්‍රමාණවත් නොවන මෘදු කුසලතා ආදී ප්‍රධාන ක්ෂේත්‍ර වෙත බැව් පර්යේෂණ ඔස්සේ පෙනී ගොස් ඇත. මෙය අධ්‍යාපනය සහ රැකියා වෙළෙඳපොළ ද අතර පවත්නා දැවැන්ත පරතරයකි.

ජනගහන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලද සමීක්ෂණයකට අනුව, 2017 ශ්‍රම ඉල්ලුම, ඉහළ ම මට්ටමේ රැකියා 30ට අදාළ ව 497,000ක් පමණ විය. ඒ හා සංසන්දනය කරන විට, රැකියා විරහිත ප්‍රතිශතය 4.5 කි. (ආසන්න වශයෙන්, පුද්ගලයන් 40,000කි.) මින් පෙනී යන්නේ රට තුළ රැකියා අවස්ථා අතිරික්තයක් තිබෙන බව ය. එය එසේ වුව ද රට තුළ රැකියා විරහිත පුද්ගලයෝ සැලකිය යුතු සංඛ්‍යාවක් සිටිති. එම තත්වයට හේතුන් විවිධාකාර ය.

## ගත යුතු ප්‍රතිපත්ති තීරණ (Policy decision)

පවත්නා පුරප්පාඩු පිරවිය නොහැකි වීමට හේතුන් වශයෙන්, පුද්ගලික අංශයේ ආයතන විසින් සඳහන් කරනු ලැබූයේ, පිරිනමනු ලැබූ රැකියාවන් භාර ගැනීමට ජනයා තුළ කැමැත්තක් නොතිබෙන බව ය. එම නිසා, විශේෂඥයන්ගේ උපදෙස් ලබා ගනිමින්, මෙම පරතරය පියවීම සඳහා රජය පියවර ගත යුතුව තිබේ. පාසල හැර යන්නන් සූදානම් කිරීමට සහ දිරි ගැන්වීමට නිසි ක්‍රමවේදයක් අනුගමනය කරනු ලබන්නේ නම්, තරමක හෝ සතුටුදායක විසඳුමක් සොයා ගැනීමට හැකිවනු ඇත.

ශ්‍රී ලංකාව යනු ලෝකයෙහි රටවල් අතුරින්, සාක්ෂරතාව ඉතාමත් ම දියුණු මට්ටමක තිබෙන රටකි. එහි සාක්ෂරතා ප්‍රතිශතය 92% ඉක්මවන අතර, සංඛ්‍යා ඥානය 46% ඉක්මවන බැව් සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ සමීක්ෂණ අනුව පැහැදිලි වෙයි. එසේ තිබිය දී ද, තරුණ ජනයාගේ රැකියා විරහිතභාවය විමර්ශනය කරන විට ශිෂ්‍යයන් රජයේ විශ්වවිද්‍යාලයක හෝ වෘත්තීය පුහුණු ආයතනයක අධ්‍යාපනය ලබා, රැකියා වෙළෙඳපොළට ඇතුළු වන්නේ සාමාන්‍ය වශයෙන්, වයස අවුරුදු 24 දී ය.

## නූතන අධ්‍යාපනයේ ප්‍රබලත ම අභියෝගය

නූතන අධ්‍යාපනයේ ප්‍රබලතම අභියෝගය නම්, වාර්ෂික ව අ.පො.ස සාමාන්‍ය පෙළ හෝ උසස් පෙළ සමත්ව (ආසන්න වශයෙන් 300,000ක් පමණ) විශ්වවිද්‍යාල අධ්‍යාපනය හෝ කාර්මික ආයතන පුහුණුව හෝ ලබා ගන්නේ සියයට 40ක් පමණ දෙනා වන අතර, ඔවුන්ගෙන් යම් පිරිසක් අදාළ අධ්‍යාපනය හා පුහුණුව අවසන් වීමට පෙර ඉන් ඉවත්වීම ය.

විශේෂඥයන්ට අනුව, මෙරට අධ්‍යාපනය සහ රැකියා වෙළෙඳපොළ අතර නොගැළපීමට හේතුව වී ඇත්තේ, රැකියා අපේක්ෂකයන් තුළ, අවශ්‍ය දැනුම, කුසලතා, රැකියා අත්දැකීම් සහ ප්‍රමාණවත් පරිගණක දැනුම හා ඉංග්‍රීසි ආදිය නොමැති වීම ය. විශේෂයෙන් ම මෘදු කුසලතා අත්කරගෙන නොසිටීම ප්‍රබලත ම හේතුව ය. රට තුළ ක්‍රියාත්මක වන සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමය එම කුසලතා වර්ධනයට යොමු වූවක් නොවේ. අධ්‍යාපනයෙහි මුල් ම අවදියෙහි සිට ම ශිෂ්‍යයන් තුළ මෘදු කුසලතා වර්ධනය කෙරෙහි ගුරුවරුන්ගේ අවධානය යොමු කරනු ලැබිය යුතු ය.

තව ද ගැටලුවක් නම්, ඉංජිනේරු විද්‍යාව, වෛද්‍ය විද්‍යාව වැනි විශේෂිත ක්ෂේත්‍රයන්ට අයත් නොවී, විශ්වවිද්‍යාල අධ්‍යාපනය නිම කරන උපාධිධාරීන් ''සුදු කරපටි රැකියා'' අපේක්ෂා කිරීම ය. ඔවුන් තුළ ඇත්තේ තමන් පිළිබඳ දුර්වල ආකල්පයක් විනා, රැකියාවන්ට අවශ්‍ය දැනුම නොවේ.

ප්‍රශ්නය වී ඇත්තේ, ජ්‍යෙෂ්ඨ පාඨශාලා මට්ටමේ දී, මෙම තරුණ තරුණියන්, ධනාත්මකව අනාගතය දෙස බැලීමට මානසිකව හුරුපුරුදු කරනු ලැබ නොතිබීම ය. ඔවුනතරින් ඇතැමෙකුට, මානව සම්පත් කළමනාකරණය, අලෙවිකරණය, ගණකාධිකරණය හෝ පරිපාලනය පිළිබඳ පශ්චාත් සුදුසුකම් තිබුණ ද, කනිෂ්ට මට්ටමේ රැකියාවක් පවා එයින් ඉගෙනීමට ඔවුන් සූදානම් නැත. රැකියා විරහිත ගැටලුව විසඳීමට නම්, මේවා ද බලධාරීන් විසින් අවධානය යොමු කරනු ලැබිය යුතු කරුණු ය.

**පවත්නා පද්ධතිය පිළිබඳ පොදු විශ්වාසය**

පාසල් අධ්‍යාපනය, විශ්වවිද්‍යාල අධ්‍යාපනය, වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව යන මෙරට අධ්‍යාපනයෙහි අවස්ථා තුන කෙරෙහි බලධාරීන්ගේ විචාරශීලී අවධානය යොමුවිය යුතු ව ඇත. බුද්ධිමතුන්ගේ පොදු විශ්වාසය නම්, ශිෂ්‍යයන් අනාගතය සඳහා යෝග්‍ය පරිදි සූදානම් කිරීමට නම්, අධ්‍යාපනයේ මුල් අවදියෙහි දී ම, ඔවුන්ගේ කුසලතා හඳුනා ගෙන, ඔවුන් අනාගතය සඳහා සූදානම් කළ යුතු බව ය. විෂයමාලාව තාක්ෂණය සහ තොරතුරු සන්නිවේදනය මුල්කරගත් එකක් විය යුතු අතර, විෂය බාහිර ක්‍රියාකාරකම් ඔස්සේ කුසලතා සංවර්ධනය සිදුවිය යුතු බව ය. විශ්වවිද්‍යාල අධ්‍යාපනය පිළිබඳ ව විශේෂඥ මතය වනුයේ, දැනට ක්‍රියාත්මක කරනු ලබන විෂයමාලාව යල් පිනූ එකක් බව ය. එනම්, රැකියා වෙළඳපළට නොගැළපෙන්නක් බව ය. විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන අතරම, සීමාවාසික රැකියා පුහුණු වැඩසටහන් (internship programs) ක්‍රියාත්මක කරනු ලැබිය යුතු බව ය.

තෘතීය අධ්‍යාපන වැඩසටහන් මගින්, දැනට ද විවිධ වෘත්තීන් සඳහා, පාසල් හැර යන්නවුන් පුහුණු කිරීම මන්දගාමී අන්දමින් සිදු කෙරෙයි. කෙසේ වුව ද, එම ආයතනයන්ට ද තව තවත් පහසුකම් සැලසිය යුතු අතර, පුද්ගලික අංශයෙහි ද සහයෝගය ඇති ව එම පුහුණුව තව තවත් පුළුල් සහ විවිධ කළ යුතු ය. මෙරට රැකියා විරහිත භාවයට ප්‍රධානතම හේතුව වනුයේ, ක්‍රියාත්මක කෙරෙමින් පවත්නා අධ්‍යාපන ක්‍රමයෙහි දුර්වලතාව සහ නොගැළපීම බව විශේෂඥ පිළිගැනීම යි.

21 සියවසෙහි උසස් අධ්‍යාපනයේ වෙනස්වීම් ඉල්ලා කරනු ලබන උද්ඝෝෂණ සංඛ්‍යාව ඉහළ යමින් පවතී. මෙම උද්ඝෝෂණයන්ට සහ සංශෝධනයන්ට හේතු වූ කරුණු කිහිපයකි.

ඒවායින් ප්‍රධානතම වන්නේ එම දශකය තුළ හටගත් ශිෂ්‍ය උද්ඝෝෂණ යි. ශිෂ්‍යයන්ගේ ප්‍රධානතම ඉල්ලීම විශ්වවිද්‍යාලයන්හි පරිපාලනය සම්බන්ධව ය. විශ්වවිද්‍යාල අධ්‍යයන කටයුතු පිළිබඳ තීරණ ගැනීමේ බලය ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන් කිහිප දෙනෙකුට පමණක් එතෙක් සීමා වී තිබුණු අතර බොහෝ රටවල එය වෙනස් කර

ශිෂ්‍ය සහභාගිත්වයට ද ඉඩ සලසා දෙනු ලැබ ඇත. බොහෝ රටවල උසස් අධ්‍යාපනයට ව්‍යාපාරික, කර්මාන්ත සහ කම්කරු සංවිධාන ද සම්බන්ධ වෙමින් සිටිති.

වැදගත් ම වෙනස විශ්වවිද්‍යාල අධ්‍යාපනය වෘත්තීයකරණය වීම ය. විශ්වවිද්‍යාලයෙන් නූතනයේ මතු වී ඇති සංකීර්ණ රැකියා අවස්ථා සඳහා අදාළ පුහුණුව ලබාදිය යුතු බවට ලොව පුරා පිළිගැනීමක් ඇති වී තිබේ. විශ්වවිද්‍යාල මගින් වෘත්තීයික නොවන ප්‍රභූ පැළැන්තියක් බිහි කිරීමේ පැරණි සම්ප්‍රදාය වර්තමානයේ පිළිග නු නො ලබයි.

සම්ප්‍රදායිකව, විශ්වවිද්‍යාල මගින්, එක්තරා මට්ටමක ස්වතන්ත්‍රතාවක් පවත්වාගෙන යනු ලබයි. බාහිර ආයතනයන්ගෙන් ඍජු බලපෑමෙන් මිදී සිටීමට ලොව පුරා විශ්වවිද්‍යාල නිතර ම උත්සාහ දරා ඇත. කෙසේ වුව ද, විශ්වවිද්‍යාල වඩ වඩාත් ප්‍රසාරණය වීම ද වියදම් අධික වීම ද හේතුවෙන් ඒවාට අරමුදල් සපයන ආයතන එනම් ප්‍රධාන වශයෙන් ම රජයන් විශ්වවිද්‍යාල වෙතින් වගවීමක් අපේක්ෂා කරයි.

ඉකුත්වූ සියවස සමාජීය ආර්ථික හා දේශපාලනික වශයෙන් ප්‍රධාන වෙනස්වීම් රාශියක් සිදු වුණු අවදියකි. දනුම සම්බන්ධයෙන් ද එම සියවසේ සිදුව ඇති වෙනස්කම් බොහෝ ය. මිනිසුන් දැනුම දෙස බලන ආකාරය ද එය ප්‍රයෝජනයට ගන්නා ආකාරය ද වෙනස් වී ඇත.

කාර්මික යුගයෙන් වෙන්කර දැක්වීම සඳහා මෙම යුගය අද හඳුන්වනු ලබන්නේ දැනුම යුගය (Knowledge Age) යනුවෙනි. 21 ශත වර්ෂයට පා තබන විට සාපේක්ෂ ව සන්නිවේදන ක්ෂේත්‍රයේ ඇතිවූ ආකර්ෂණීය වර්ධනය හේතුකොට ගෙන එහි පළමුවැනි කාර්තුව නිම වීමටත් පෙර වත්මන් සමාජය 'දැනුම යුගයට' අවතීර්ණ වෙමින් පවතී. දැනුම යුගය යනු ධනවාදයේ වඩාත් දියුණු වූ ස්වරූපයකි. එම යුගයේ දී භූමිය, ශ්‍රමය, මුදල් සහ වෙනත් ස්පර්ශීය සම්පත්වලට ද වඩා වැදගත් ආර්ථික වර්ධන මූලාශ්‍රය වන්නේ දැනුම ය. නව ශ්‍රම රටා සහ නව ව්‍යාපාරික භාවිතයන් බිහි වී ඇති අතර එහි ප්‍රතිඵලයක් වශයෙන්, අලුත් සහ වෙනස් කුසලතා සහිත ශ්‍රමිකයන් අවශ්‍ය වී ඇත.

ඒ සමග ම 'දැනුම' යන්නෙහි අර්ථය ද වෙනස් වෙමින් පවතී. පෙරදී මෙන් දැනුම යනු විශේෂඥයන්ගේ මොළ තුළ සංවර්ධනය වන සහ ගබඩා වී ඇති පොත පත මගින් ඉදිරිපත් කෙරෙන විෂය ධාරා ලෙසින් වර්ගීකරණය කෙරෙන සිද්ධාන්ත හෝ න්‍යායික වූ ''දෙයක්'' ලෙසින් තව දුරටත් නො සැලකෙයි. මෙම දැනුම යුගය තුළ දැනුම සලකනු ලබන්නේ යම් යම් දේ හට ගන්වන සහ හට ගැනීමට සලස්වන බලයක් හෙවත් ''ශක්ති විශේෂයක්'' (Form of Energy) වශයෙනි.

කලකට පෙර ''දැනුම් සමාජයක්'' (Knowledge Society) ගැන අසන්නට ලැබුණි. එනම් හැම දෙනා ම ඉගෙනුම ලබන විඥාපන සමාජයකි. 'දැනුම' ආලෝකය ට සමාන කැරෙන අතර එය සීමා මායිම් වලින් තොරව ආලෝකය විහිදුව යි. එහෙත් මෑත කාලයේ පළවූ ලෝක බැංකු වාර්තාවලින් අනාවරණය පරිදි ලොව පුරා බිලියන සංඛ්‍යාත ජනතාවක් ඉන් ප්‍රතිලාභ නොලබා දරිද්‍රතාවෙන් යුතුව දෛනික ජීවිතය ගත කරන බවත් දැක්වෙයි.

එක් අතකින් දැනුම සමාජය මනෝමූලික පරිකල්පනාවක් වන අතර එය සර්වප්‍රකාරයෙන් ම පරිපූර්ණ සමාජ යථාර්ථයක් නොවේ. ලෝකය වෙනස් වී පවතී. මිනිසා ලෝකය ලෙස බලන ආකාරය ද වෙනස් වෙමින් පවතී. අනාගත සමාජයට අවශ්‍ය වන්නේ ඊට සරිලන අධ්‍යාපනයකි. වචන දෙක අතර ලොකු වෙනසක් නැති වුව ද ''විඥාපන සමාජයක්'' යන්නට විකල්ප යෙදුමක් වශයෙන් ද 'දැනුම් යුගය' සැලකිය හැකි වේ.

දැනුම නිර්වචනය කෙරෙන්නේ සහ අගයනු ලබන්නේ ද එහි තත්ත්වය අනුව නොව, එයට කළ හැකි දේ අනුව ය. එය නිපදවනු ලබන්නේ තනි පුද්ගල විශේෂඥයන් විසින් නොව, ''ඒකරාශිගත බුද්ධිය'' විසිනි. එනම්, විශේෂිත පරමාර්ථ සඳහා සාමූහික ව කටයුතු කරන, විශේෂඥ කුසලතා සහිත ජන කණ්ඩායම් විසිනි. මෙම වෙනස්වීම් අපගේ අධ්‍යාපනය කෙරෙහි ද විශේෂයෙන් බලපානු ඇත. මිනිසා අධ්‍යාපනය ලැබිය යුත්තේ හුදෙක් නිෂ්පාදකයකු වීම සහ පාරිභෝගිකයකු වීමට පමණක් නොවන බවට පැවැති දාර්ශනික පෙරවදන 21 ශතවර්ෂය ඉදිරියේ එන දැනුම අවධියේ තව දුරටත් යථාර්ථවත් නොවනු ඇත.

කාර්මික යුගයේ දී (විසිවෙනි සියවස) මිනිසුන්ට අවශ්‍ය වූයේ ''කුමක්ද'' යන වර්ෂයේ දැනුමකි. මෙම දැනුම බෙදා හැරීම සඳහා පාසල් බිහි වූ අතර, මහා පරිමාණ අධ්‍යාපන ක්‍රම, පද්ධති, ජාල ආරම්භ විය. එමගින් වයස් අනුව, මෙම ''කුමක් ද?'' යන දැනුම ළමයින්ට බෙදා හැරෙයි. එම දැනුම, කාර්මික යුගයට අවශ්‍ය අන්දමේ විවිධ වර්ගයේ ශ්‍රමික පුරවැසියන් බිහි කිරීම අරමුණු කරගත්තකි. කෙසේ වුව ද, එමගින් සිදුවන ''දැනුම් නාස්තිය'' අතිවිශාල ය.

නිදසුනක් වශයෙන් ශ්‍රී ලංකාවේ රජයේ ප්‍රධාන අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හා පද්ධතිය එල්ල කොට ඇත්තේ විශ්ව විද්‍යාල ප්‍රවේශය දෙසට ය. එහෙත් තවමත් එහි නිසි එල ලබා විශ්වවිද්‍යාලයට ප්‍රවේශ වන්නේ 3%කටත් අඩු සංඛ්‍යාවකි. අන් සියල්ලෝම ඉන් මග හැරෙන්නෝ වෙති. ඔවුන් සඳහා වෙන වෙනම විකල්ප සැලසුම් නැත. තිබුනත් ඒවා ප්‍රමාණවත් හෝ සමකාලීන ඉල්ලුමට සරිලන්නේ නැත. මෙසේ මග හැරෙන්නන්ගෙන් විශාල සංඛ්‍යාවක් ඉලක්ක නොමැතිව ඉබාගාතේ යන්නෝ බවට පත්වෙති. දැනුම නාස්තිය සිදු වන්නේ ඒ ආකාරයෙනි.

පශ්චාත් කාර්මික යුගයට ද එනම්, දැනුම යුගයටද මෙම ''කුමක් ද?'' දැනුම අවශ්‍ය නමුදු, එයට වඩාත් අවශ්‍ය වන්නේ ඊට වැඩි දැනුමකි. එම යුගයට අවශ්‍ය වන්නේ එම දැනුම ප්‍රයෝජනයට ගෙන යම් යම් දේ කිරීම ය. නව දැනුම නිර්මාණය කිරීම සඳහා එම දැනුම ප්‍රයෝජනයට ගැනීමය. ''කුමක්ද?'' දැනුම පශ්චාත් කාර්මික යුගයට (දැනුම යුගයට) ද අවශ්‍ය නමුදු එය අවසාන ඉලක්කය නො වෙයි. එය තවදුරටත් ඉගෙනීම (සිතීම) සඳහා මුලක් පමණකි. දැනුම යුගයෙහි විශේෂ ලක්ෂණය වන්නේ ස්ථාවරභාවය නොව විපරිණාමය (Change) යි. ඒ අනුව නව නිර්මාණ නිෂ්පාදනයට උපයුක්ත නොවන හුදෙක් ''කුමක් ද?'' දැනුම පමණක් ප්‍රමාණවත් නොවෙයි. ඒ දැනුම යුගයට ඉල්ලා සිටින්නේ ''කුමක් ද?'' දැනුම ඉක්මවා සිය ''කිරීමේ'' (Doing) දැනුමකි.

කවර සමාජයක් වුව ද කායික හා මානසික වශයෙන් වැඩ කිරීමෙන් හා නිෂ්පාදනයෙන් තොරව සාර්ථක ලෙස පවත්වා ගෙන යාම උගහට ය. මේ අනුව ''කිරීමේ'' දැනුම සමාජීය සංවර්ධනය ට

මෙන් ම පුද්ගල සංවර්ධනයට ද අත්‍යවශ්‍ය සාධකය බව පිළිගත යුතුව පවතී. දැනුම යුගයට අවශ්‍ය කරන්නේ, නව තොරතුරු ඉක්මනින් ස්ථානගත කිරීමට, තක්සේරු කිරීමට හා නියෝජනය කිරීමට සමත් ශ්‍රමික පුරවැසියන් ය. අනෙකුත් අය සමග සන්නිවේදනයෙහි යෙදීමට ද, එකතු වී එලදායි අයුරින් වැඩ කිරීමට ද ඔවුන් සමත්විය යුතු ය. අනුගත වීමට ද, නිර්මාණශීලී වීමට සහ සැම දෙයක්ම පද්ධතිගත අන්දමින් තේරුම්ගැනීමටද ඔවුන් සමත්විය යුතු ය. බාහිර උපකාරකයන්ගෙන් තොර ව, තමන් විසින් ම සිතීමට සහ ඉගෙනීමට ඔවුන් සමත් විය යුතු ය.

''කුමක් ද?'' සහ ''කෙසේ ද?'' යන ආකාරයේ දැනුමෙහි උපයෝගීතාව දීර්ඝකාලීන නොවන හෙයින්, පාසලේ දී, එම දැනුමෙන් ළමයින්ගේ මොළ පිරවීමට දැනුම යුගයේ දී යෝග්‍ය නොවේ. එසේ ම යමක් කිරීමේ ''හොඳම ක්‍රමය'' ඉගැන්වීම ද හානිකර ය. අවශ්‍ය වන්නේ ''කළ යුතු දෙය'' සහ ''කළ යුතු අන්දම'' තමන් ම සිතා බලා තීරණය කර ගැනීමට ශිෂ්‍යයන් පුහුණු කළ යුතු වෙයි. මින් හැඟවෙන්නේ ''කිරීමේ'' දැනුමට ඉගෙනුම විතැන් විය යුතු බව ය.

ඇමරිකා එක්සත් ජනපදයේ පාසල් විෂයමාලාවට ශ්‍රේෂ්ඨ මිනිසුන්ගේ චරිත කතා රැගත් ග්‍රන්ථ නිර්දිෂ්ට කොට ඒවා අනිවාර්යෙන් හැදෑරීමට යොමු කරන ලද්දේ සිසුන් තුළ ශ්‍රේෂ්ඨත්වය මෙන් ම ස්වීයත්වය වර්ධනය කරවීමේ අපේක්ෂාවෙන් බව අධ්‍යාපනඥ මෝර්ටිමර් ඇඩ්ලර් (Mortimer Adler) සඳහන් කරයි. දැනුම යුගය වන විට එවැනි චරිත කතා යළි නිෂ්පාදනයට හෝ සැබැවින් ම ක්‍රියාකාරිත්වයට නැගීමට සිදුවනු ඇත.

අද පාසල් අධ්‍යාපනය මගින් සිදුවන්නේ කාර්මික යුගයට අවශ්‍ය ශ්‍රමික පුරවැසියන් බිහි කිරීම ය. ''දැනුම යුගයට'' අවශ්‍ය ශ්‍රමික පුරවැසියන් බිහි කිරීමට නම් පාසල් හි ඉගැන්වීම වෙනස් විය යුතු ය. එම යුගයට අවශ්‍ය වන්නේ අමුතුම දක්ෂතා සහ නැඹුරුතාවන් ය.

කැනේඩියානු අධ්‍යාපනඥයකු වන Audy Hargreaves පෙන්වා දෙනු ලබන්නේ ගුරු වෘත්තීය මාර්ගයෙන් බෙදා හැරෙන වත්මන් අධ්‍යාපනය මහත් පරිවර්තනයට පාත්‍ර වෙමින් පවත්නා බවයි. පාසලින් පිටත සමාජ - ලෝකය අධික වෙනස්වීම්වලට භාජනය

වෙමින් පවතී. ඩිජිටල් විප්ලවය, කාලය හා අවකාශය (Time & Space) හමුවේ ගුරු වෘත්තීය අධ්‍යාපනය මහත් අභියෝගයට ලක් වී පවතී.

මෙය හුදෙක් ම, දැනට ක්‍රියාත්මක විෂයමාලාව තුළට ''නව'' දක්ෂතා සහ නැඹුරුතා ඇතුළු කිරීමෙන් පමණක් ම ඉටුකරගත නොහැක්කකි. එමගින් වනු ඇත්තේ දැනට ම ද ගුරුවරුන් මත පැට වී ඇති අධික බර තවත් වැඩිවීම පමණකි. එමගින් 21 සියවස අපර භාගය සඳහා යෝග්‍ය අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කළ නො හැකි ය.

'ලෝකය එකම යායක්' බවට පත්වෙමින් පවත්නා වත්මන් හි යමක් ''කිරීම'' ගැන නිශ්චිත ගමක්, රටක්, ස්ථානීය වටිනාකමක් හෝ පිළිබිඹු නොවෙයි. මානව ප්‍රාග්ධනය (Human Capital) මෙන් ම ඒ ඔස්සේ සමාජ ප්‍රාග්ධනය ද (Social Capital) රටක නිශ්චිත සංවර්ධනය සඳහා ඉලක්ක කොට ගත හැක්කේ දැනුම අවධිය අර්ථකථනය අනුව ලැබූ දැනුම ක්‍රියාවට නැංවීමේ හැකියාව මතය. අද බොහෝ දෙනා කතා කරන දැනුම ආර්ථිකයට (Knowledge Economy) පදනම් වී ඇත්තේ ද මෙම සංකල්පය බව පෙනී යයි.

**දැනුම් ආර්ථිකය හා ශ්‍රී ලංකාවේ සංවර්ධනය**

වර්තමානයේ ලොව බොහෝ රටවල සංවර්ධනයේ මූලික කේන්ද්‍රීය දැනුම ආර්ථිකය බව සඳහන් කළ හැකි ය. එංගලන්තය ඇමරිකාව, නවසීලන්තය, ප්‍රංශය, ජර්මනිය වැනි දැවැන්ත දියුණු රටවල මෙන් ම අප අවට සිටින සිංගප්පූරුව, මැලේසියාව, ඉන්දියාව, නේපාලය පවා තම ආර්ථික සංවර්ධනයේ ඉලක්ක සපුරා ගැනීම සඳහා දැනුම ආර්ථිකය වැලඳගෙන ඇත.

දැනුම් ආර්ථිකය හැඳින්වීම සඳහා අන්තර්ජාලයේ පවතින තවත් නිර්වචනයක් දැක්විය හැකි ය. ඒ අනුව ''ආර්ථික වර්ධනය හා සංවර්ධනය සඳහා දැනුම නිපදවීම නව දැනුම අත්පත් කර ගැනීම, පවතින දැනුම බෙදා හැරීම දැනුම් ආර්ථිකය'' වශයෙන් දැක්විය හැකි ය.

වත්මන් හි දියුණු හා දියුණු වෙමින් පවත්නා ඇතැම් රටවල තම ආර්ථික සංවර්ධනයේ ඉලක්ක සපුරා ගැනීම සඳහා 'දැනුම් ආර්ථිකය' සංකල්පය භාවිත කරයි. පාරිභෝගිකවාදී සමාජයට උචිත ලෙස දැනුම හසුරුවනු ලැබීම හා මෙහෙය වීම මෙහි මූලික අපේක්ෂාව වේ.

මානව සම්පත් සංවර්ධනය යනු, උසස් අධ්‍යාපනයේ ඉතා වැදගත් පදනමකි. විශ්වවිද්‍යාල වැනි උසස් අධ්‍යාපන ආයතන දැනුම උත්පාදනයෙහි සහ නිර්මාණයෙහි ද, ආරක්ෂා කිරීමෙහි සහ ශිෂ්‍යයන් හා ප්‍රජාව වෙත දැනුම සමර්පණය කිරීමෙහි ද නිරතව සිටියි. අධ්‍යාපනය ඔස්සේ අත්කරගන්නා දැනුම පුද්ගලයකුට මෙන් ම සමාජයටද ශක්තිය ලබාදී, නූතන ලෝකයේ ගෝලීයකරණය වූ අභියෝගයන්ට ආත්ම විශ්වාසයකින් යුතුව මුහුණදීමේ හැකියාව ඇති කරයි.

දැනුම් ආර්ථිකය මූලික ලක්ෂණ 8ක් හඳුනාගෙන ඇත. ඒවා මෙසේ ය.

1. ආර්ථිකය තුළ නව දැනුම සෙවීම.
2. පොදුවේ තොරතුරු තාක්ෂණය ඔසවා තැබීම.
3. ආර්ථික නිෂ්පාදන සඳහා දැනුම එල්ල කර ගැනීම
4. දැනුම වාණිජකරණය දක්වා වැඩි දියුණු කිරීම.
5. දැනුම වර්ධනය උදෙසා ශිල්පීය දැනුමැති අය වැඩි කිරීම.
6. දැනුමේ බලපෑම ආර්ථිකයේ විවිධ අංශ කරා විසුරුවා හැරීම.
7. දැනුම කළමනාකරණ කුසලතා වැඩි දියුණු කිරීම.
8. දැනුම ආර්ථිකය ගෝලීයකරණ සංකල්පය සමග ඒකාබද්ධ වීම.

මනාව සකස්කරනු ලබන ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග මගින් ගැටලු විසඳීම සඳහා උපකාරී වන විශ්ලේෂණාත්මක චින්තනය,

ධනාත්මක ආකල්ප, කුසලතා සහ තොරතුරු රැස් කිරීමේ නිපුණතා ප්‍රවර්ධනය කෙරෙයි. අවසානයේ දී සමාජයට ධනාත්මක දායකත්වය සැලසීමට සමත් පුද්ගලයකු බිහිකෙරෙයි. කෙනෙකු ලබාගන්නා අධ්‍යාපනය, එම පුද්ගලයාගේ පමණක් නොව, සමාජයේ ද ජාතීන්ගේ සහ සමස්තයක් ලෙසින් මුලු ලෝකයේ ම යහපත පිණිස වෙයි. අධ්‍යාපනය යනු සෑම ජාතියක් විසින් ම සලසා දිය යුතු මූලික මානව හිමිකම් අතුරින් එකක් වශයෙන් පිළිගනු ලබන්නේ එහෙයිනි.

ලෝක බැංකුව යටතේ පවතින Economic Intelligence Unit නම් වූ ආයතනය 2006 දී දැනුම ආර්ථිකය රඳා පවතින්නා වූ ප්‍රධාන කුළුණු 4ක් ඉදිරිපත් කළේය. එනම්,

1. ව්‍යාපාරික පරිසරය (Business Enviornment)

2. තොරතුරු යටිතල පහසුකම් (Information Technology)

3. නවෝත්පාදනය (Ennovation System)

4. මානව සම්පත (Cultivating a Scientific Culture)

මෙහි (1) ව්‍යාපාරික පරිසරය යනු රටක ව්‍යාපාරික ගනුදෙනු සඳහා බියෙන්, සැකෙන්, යුධ කෝලාහලවලින් තොරව කටයුතු කිරීම සඳහා සාමකාමී නිදහස් සාධාරණ සමාජ වාතාවරණයක් පැවතීම ය. (2) තොරතුරු යටිතල පහසුකම් යනුවෙන් අදහස් කැරෙන්නේ දැනුම ආර්ථික සමාජීය කාර්යක්ෂමතාව සඳහා ඉක්මන් සන්නිවේදන කටයුතු සඳහා අවශ්‍ය සන්නිවේදන පහසුකම්වලින් යුක්ත වීම ය. මේ අනුව දැනුම ආර්ථිකයට උචිත පරිදි අන්තර්ජාලය, විද්‍යුත් තැපැල හා ඉංග්‍රීසි භාෂාව දැන උගත්වීම ප්‍රධාන කොට සලකනු ලබයි. (3) නවෝත්පාදනය යනුවෙන් අදහස් කරන්නේ එහි වාච්‍ය අර්ථය පරිදි දැක්ම නව නිෂ්පාදන, නිර්මාණ. නව අදහස් ගලනය ඔස්සේ සංවර්ධනය සඳහා උචිත සංකල්ප පහළ වීම ය. (4) අවසාන කුළුණ වන මානව සම්පත් ප්‍රවර්ධනය එක එල්ලේම අධ්‍යාපනය හා සම්බන්ධ වන බව පෙනී යයි. විශේෂයෙන් ම රටක උසස් අධ්‍යාපනය, කාර්මික, තාක්ෂණික, විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනය ආදී වශයෙන් උගතුන් විශාල වශයෙන් බිහි කිරීමට ඇති ප්‍රාගුණ්‍යතාව මින් අදහස් කෙරෙයි. එය දියුණු හෝ දියුණු වෙමින් පවතින තත්ත්වයක පැවතිය යුතු ය.

නිදහස ලැබීමෙන් පසු, ශ්‍රී ලංකාව තෘතීය මට්ටම දක්වා නිදහස් අධ්‍යාපනය සලස්වා ඇති අතර, එමගින් 95% ක සාක්ෂරතාවක් අත්කර ගැනීම සමත්ව තිබේ. එම ජයග්‍රහණය මත පිහිටා ශ්‍රී ලංකාව ''ආසියාවේ ආශ්චර්යය'' බවට පත් කිරීමේ ක්‍රමෝපායයේ දී සංවර්ධනය කළ යුතුවන ක්ෂේත්‍ර පහ අතුරින් එකක් ලෙස ''දැනුම කේන්ද්‍රය'' හඳුනාගනු ලැබ ඇත.

පසුගිය කාලය වෙත ආපසු හැරී බලන විට ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ කර්මාන්ත හා කෘෂිකර්මාන්තයේ දායකත්වය ඉක්මවා සේවා අංශයේ දායකත්වය ඉදිරියට වර්ධනය වී ඇත. එසේ වුව ද ශ්‍රී ලංකාවේ පිහිටීම භූගෝලීය සාධක අනුව කෘෂිකාර්මික ආර්ථිකයකට පවතින ඉඩ ප්‍රස්තා සුලු පටු නො වේ. මේ අනුව රටේ නිෂ්පාදන ජාතික මෙහෙවර සේවා අංශයෙන් මෙන් ම කෘෂිකාර්මික අංශයෙන් ද සංවර්ධනය කළ හැකි වීමේ ඉඩ ප්‍රස්තා පවතී. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) පෙන්වා දෙන පරිදි විදුලි සංදේශ අංශයේ සැහෙන වර්ධනයක් පෙන්නුම් කර ඇත.

අධ්‍යාපනය කුසලතා සහ නිපුණතා සංවර්ධනය සඳහා සුවිශේෂී පදනමක් වන අතර තෘතීය අධ්‍යාපනය දැනුමෙන් සහ බහුවෛෂයික කුසලතාවන්ගෙන් පුද්ගලයා තව දුරටත් බලගන්වයි.

පුද්ගල මතයට ගරු කිරීම, විශ්වාසය සහ කණ්ඩායම් හැඟීම වැනි හර ප්‍රගුණ කරනු ලබන්නේ අධ්‍යාපනය මගිනි.

දැනුම් ආර්ථිකය සඳහා අධ්‍යාපනය Education for Knowladge Economy (EKE) සංකල්පය පැහැදිලි කරමින් ලෝක බැංකුව පවසන්නේ උසස් කුසලතාවලින් හෙබි නම්‍යශීලී මානව ප්‍රාග්ධනය ගෝලීයකරණය වෙළෙඳපොළේ තරඟකාරිත්වයට හේතු වන බව යි.

රටක ජාතික සංවර්ධනය සඳහා උගත් බුද්ධිමතුන් බිහිකළ යුතුවෙ යි. මෙම සන්දර්භය තුළ බහුප්‍රකාර බෙදා හැරීමේ ක්‍රමයක් ඔස්සේ මාර්ග ගත පාඨමාලා සැපයීම සඳහා ප්‍රායෝගික සරසවියක් සංවර්ධනය කිරීමේ ධෛර්යවන්ත උත්සාහයක කොළඹ සරසවියේ දී සිටියි. මෙමගින් විශේෂයෙන් ශ්‍රී ලංකාවට ද පොදුවේ ජාත්‍යන්තර

ප්‍රජාවට ද රටෙහි තෘතීය අධ්‍යාපනයෙහි පවත්නා අඩුලුහුඬුකම් සපුරාගැනීමට අවස්ථාව සැලසෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. Cisco-Networking Academy හි ද, Microsoft ICT Advanced Academy හි ද, ගෝලීය පන්තිකාමර වැඩසටහනට කොළඹ සරසවිය දැනටමත් සම්බන්ධනය වී සිටියි. ඒ හා සමාන ජාත්‍යන්තර වෘත්තීය සහතික පිරිනැමීමේ වැඩ පිළිවෙළකට ගෝලීය Project Management Institute සමග සාමූහිකව කටයුතු කිරීම සඳහා ද පියවර ගනු ලබමින් ඇත. මානව සම්පත් හි වෘත්තීය දියුණුව සඳහා මෙවැනි ගෝලීය විශ්වවිද්‍යාල ව්‍යාපාර සාමූහිකත්වයන් අතිශයින් වැදගත් වේ.

එසේ වුව ද පසුගිය කාලයේ දැනුම ආර්ථිකයට ළඟා වීමට ශ්‍රී ලංකාව දැරූ උත්සාහය අනෙකුත් රටවලට සාපේක්ෂව අපේක්ෂිත මට්ටමට ළඟා වී නොමැත. මැලේසියාව, සිංගප්පූරුව, චීනය, කොරියාව වැනි සෙසු රටවල් ශ්‍රී ලංකාව වඩා ඉදිරියෙන් සිටී.

**දැනුම් ආර්ථිකය සහ උසස් අධ්‍යාපනය**

දැනුම ආර්ථිකය සංකල්පයට මහත් ප්‍රසිද්ධියක් ලැබුනේ 1990 ගණන්වලදී නවසීලන්තයේ දී ය. දනුම ආර්ථිකයට අදාළ බුද්ධි විෂයික හා නිර්මාණාත්මක වූ නිෂ්පාදන හා සේවා පද්ධතියක් එරට හඳුන්වා දීමත් සමග මෙම ප්‍රසිද්ධිය අත්විඳ එරට ව්‍යාපාර ගණනාවකින් තම තමන්ගේ ක්ෂේත්‍රවල නවෝත්පාදනයන් බිහි කොට දැනුම ආර්ථිකය සංකල්පය මොනොවට අර්ථවත් කළේ ය. එසේ පසුගිය විසි වසරක පමණ කාලය තුළ කොරියාව, තායිවානය, ඇමරිකාව, එංගලන්තය යන රටවල් ද දනුම ආර්ථික සංකල්පයෙන් මහත් ඵල ප්‍රයෝජන අත්පත් කර ගත්හ. ඒ සමග ඔවුහු ලෝකයේ ප්‍රමුඛ ආර්ථික නිෂ්පාදිතයන් බවට තරඟකාරී ස්ථාවරයක් ඇති කරවා ගත්හ.

රටක ආර්ථිකය දැනුම ආර්ථිකයක් බවට පත්වන්නේ, නව දැනුම තිරසර භාවිතය එරට ජාතික සංවර්ධන ක්‍රියාවලියෙහි ප්‍රධාන අංගයක් වූ විට ය. නව දැනුම අත්කර ගැනීම සහ පතුරුවා හැරීම සඳහා තොරතුරු සන්නිවේදනය තාක්ෂණික ක්‍රම (ICT) අත්‍යවශ්‍ය ය.

ඉතිහාසය ආරම්භයෙහි සිට ම, නව දැනුම සහ නවීකරණයන් ද, තරඟකාරිත්වය ඔස්සේ, සංවර්ධනය සම්බන්ධයෙන් ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටුකර ඇත. ගෝලීයකරණය ද ඉකුත් අවසන් දශක කිහිපය තුළ හටගත් තාක්ෂණික විප්ලවය ද සමග ම දැනුම ආර්ථික සංවර්ධනයෙහි ප්‍රධාන මෙහෙයුම්කරු බවට පත් ව ඇත.

ආර්ථික සංවර්ධනයෙහි නවීකරණය සඳහා දැනුම මූලික වී ඇත. දැනුම මූලික ආර්ථිකයන් සහිත රටවල් අලුතින් උදා වූ අවස්ථාවන්ගෙන් ප්‍රයෝජන ගෙන ඉහළ වර්ධන වේගයකින් සහ ඵලදායිතාවක් ද අත්කර ගෙන ඇත. යුරෝපයෙහි කුඩා එහෙත් ක්‍රියාශීලී ආර්ථිකයන් දැනුම මූලික වර්ධනයෙහි ආදර්ශ බවට පත්ව සිටී. මානව සම්පත්හි දැවැන්තයන් වන චීනය සහ ඉන්දියාව, උසස් අධ්‍යාපනයෙන් අසීමිත ඵල ප්‍රයෝජන අත්කර ගනිමින් සිටිති. සිවිල් යුද ගැටුම් අවසන් වීමෙන් පසුව ශ්‍රී ලංකාවේ ද නව දැනුම මුල්කරගත් මානව ප්‍රාග්ධන සංවර්ධනය ආරම්භ කළ හැකි ය. ගැටුමට ප්‍රධාන හේතුවක්ව ඇත්තේ ''බුද්ධිමය දරිද්‍රතාව'' මත වේ. එවන් ගැටුමට විසඳුම විය හැක්කේ අධ්‍යාපනය ඔස්සේ ආර්ථික බලගැන්වීම ය. දැනුම සහ කුසලතා වර්ධනය කරමින් ග්‍රාමීය අංශය පණගැන්වීමේ සහ සංහිඳියාව සහිත ජාතික සංවර්ධනය ඇති කිරීමේ ශක්තිය ඇත්තේ තෘතීය අධ්‍යාපනයේ දියුණුව තුළ ය. දැනුම ආර්ථිකයක් වෙත සංක්‍රාන්තිය සාර්ථක වන්නේ දැනුම මූලික දක්ෂතා සහිත ශ්‍රම බලකායක් ගොඩනැඟීමට විශ්වවිද්‍යාල දක්වන දායකත්වයෙහි ප්‍රමාණය අනුව ය.

අධ්‍යාපනය ඔස්සේ අත්කර ගන්නා දැනුම, ආර්ථික සංවර්ධනයට හේතුවන බව සනාථ කෙරෙන එක් නිදර්ශනයක් ගනිමු. එනම්, කොළඹ විශ්වවිද්‍යාලයේ කෙසෙල් සඳහා පටක රෝපණ තාක්ෂණය සම්බන්ධයෙන් කරන ලද පර්යේෂණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වෙයි. එම තාක්ෂණය ගම්බද ගොවියන් විසින් සාදරයෙන් පිළිගන්නා ලදුව එමගින් ඔවුන්ගේ ආදායම වැඩි වී ඇති බැව් පැහැදිලි ව දක්නට ඇත. එහි සාර්ථකත්වය ආදර්ශයට ගනිමින්, කොළඹ විශ්වවිද්‍යාලය, එහි කෘෂි තාක්ෂණ සහ ග්‍රාමීය විද්‍යා ආයතනය ඔස්සේ, ග්‍රාමීය ගොවි ප්‍රජාව ඉලක්ක කරගත් කෘෂි තාක්ෂණ සහතික පත් පාඨමාලාවක් ද (ශ්‍රී ලංකාවේ දකුණු ප්‍රදේශයෙහි) ආරම්භ කර තිබේ.

පරිගණකයට අත තබා හෝ නොසිටි ගැමි ගොවියන් වෙත මෙවලම් භාවිතය පිළිබඳ මූලික පුහුණුවක් ප්‍රථමයෙන් ම සලස්වනු ලැබිණ. ඒ ඔස්සේ ඔවුහු එම පාඨමාලා සාර්ථකව හදාරමින් සිටිති. එමගින් අත්කර ගන්නා දැනුම ඔවුන්ගේ කෘෂිකාර්මික කටයුතු දියුණු කර ගැනීම සඳහා යොදා ගැනීමට හැකිවනු ඇත. තෘතීය අධ්‍යාපනය හදාරා නව දැනුම අත්කර ගැනීමේ වුවමනාවක් මිනිසුන් තුළ ඇත. දැනුම් ආර්ථිකයට සම්බන්ධ ඉහළ විභවයන් ශ්‍රී ලංකාවෙහි පවතී.

ශ්‍රී ලංකාව දැනුම ආර්ථිකය අවශ්‍ය ද? ඒ සඳහා ප්‍රමාණවත් පහසුකම් තිබේ ද? ශ්‍රී ලංකාවට ඒ සඳහා ළඟාවිය හැකි ද? ළඟාවිය හැකිනම් අත්කරගත හැකි වාසි කවරේ ද? දැනුම් ආර්ථිකය මඟ හැරීමෙන් සිදුවන අවාසි කවරේ ද? ආදි වශයෙන් මේ සඳහා පක්ෂ විපක්ෂ වශයෙන් තර්ක රාශියක් ගොඩනැගී ඇත. තුර්කියේ අධ්‍යාපන නවීකරණ විශේෂඥයකු වූ මැනුවෙල් ජාෆ්රින් තුර්කියේ අධ්‍යාපනය දැනුම ආර්ථිකය වෙත ගෙන යාම සඳහා ඉදිරිපත් කළ නිර්දේශ 7 අප රටට සාපේක්ෂව කෙතෙක් දුරට අදාළ වේදැයි පරීක්ෂා කළ හැකි ය.

1. සන්නිවේදන තරංග පරාශය ඉහළ නැංවීම.
2. සියලු අවශ්‍යතා අන්තර්ජාලයේ පළ කිරීම.
3. සංඛ්‍යාත විෂයමාලාවන් හි ආයෝජනය
4. විවෘත ප්‍රමිතීන්ට එකඟව සියල්ල ගොඩනැගීම
5. නිදහස් මෘදුකාංගවල වාසිය ලබා ගැනීම
6. පරිගණක උපයෝජනය ආදර්ශයක් බවට පත්වීම.

මේ හැර පාසල් පද්ධතිය හා අධ්‍යාපන ක්‍රමය තුළ අපට පෙනී යන පරිදි විසඳාගත යුතු ගැටලු මෙසේ දැක්විය හැකි ය.

1. දැනුම් ආර්ථිකය ගැන ගුරුවරුන්ට අවබෝධයක් නැත.
2. තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ පුහුණුව ප්‍රමාණවත් නැත.
3. මන්දගාමී අන්තර්ජාල පහසුකම්.

4. ආරක්ෂාව හා තත්ත්ව පාලන ගැටලු.
5. අවශ්‍ය තාක්ෂණය නව්‍ය කිරීමේ ඉහළ පිරිවැය.
6. පාසල් අතර අසමානතාව.
7. රජය අධ්‍යාපනයට වැය කරන සමස්ත පිරිවැය පහළ මට්ටමක පැවතීම.
8. විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අවශ්‍ය සියලු ම යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම.
9. විශ්වවිද්‍යාලයීය ආචාර්යවරුන්ට/සිසුන්ට ලැබෙන විදේශීය පුහුණු ඉගෙනුම් අවස්ථා ප්‍රමාණවත් නොවීම.
10. අප රට විශ්වවිද්‍යාලවලට විදේශීය සිසුන් ඇතුළත් වීම ඉතාම අඩු තත්ත්වයක පැවතීම.

## සමාලෝචනය

දශක තුනක් පුරා විඳි දුක් පීඩාවන් නිමවීමෙන් පසුව, ජාතික සංවර්ධනයට උරදෙමින් සාමයෙන් ජීවත් වීමේ අවස්ථාව ශ්‍රී ලාංකික ජනතාවට දැන් උදා වී තිබේ. ඉහළ මට්ටමේ බුද්ධිමය ශක්‍යතාවක සහ සාක්ෂරාවක් ද ශ්‍රී ලංකාවෙහි පවත්නා හෙයින් එය ජාතික සම්පත් හා සම්බන්ධ කර ගනිමින් ආසියාවේ ශක්තිමත් ආර්ථිකයක් බවට පත්වීම සිහිනයක් නොවනු ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ


අබේපාල, රෝලන්ඩ් (2020). *තුලනාත්මක අධ්‍යාපනය හා අධ්‍යාපනයේ නව ප්‍රවණතා ගැටලු*, සාර ප්‍රකාශන, කොට්ටාව.

අබේපාල, රෝලන්ඩ්. (2018). *සමකාලීන අධ්‍යාපන සංකල්ප*, සාර ප්‍රකාශන, කොට්ටාව.

අබේපාල, රෝලන්ඩ් (2022). *21 වන සියවස සඳහා පශ්චාත් නූතන අධ්‍යාපනය* (මුද්‍රණයේ) සාර ප්‍රකාශන, කොට්ටාව.

Bhaskar Chatterjee (2011). *Education for all the Indian Saga*, Published by Lotus Press.

Graro, mohanlal (2019) "*Mismatch between the Education system and the job market in Srilanka with special reference to soft skills*"

Howard Gardner (2011) *Truth, Beauty and Goodness Reframed* New York 10016.

Rotherham, A.J.& Wilingham,D (2009). *21st Century skills: the challenges ahead. Educational leadership*.

Sedere M Upali, (2019). *First Edition, Education Meeting Knowledge Economy*, White Falcon Publishing.

**Web Site:**

21st Century Learning Skills and Strategies, Written by Lakshmi Annapuma Chintaluri, independent Education Consultant.

21st Century standards and Curriculum: Current Research and

Practice, Dr. Patrick McGuire.

The Universal Competency Framework Professor Dave Bartram.

What is knowledge Economy.

What is a 21st-Centure Skills-based Education?